## සාරාංශය

කිසියම් අධ්‍යාපන ක්‍රියාවලියක සාර්ථකත්වය විවිධ සාධක රාශියක් මගින් තීරණය වේ. ඉන් අධ්‍යාපනික ක්‍රියාවලියේ ඵලවල ගුණාත්මක බව තීරණය කරන එය මෙහෙයවන්නන් සතු ප්‍රබල සාධකය ලෙස විෂයමාලාව හැඳින්විය හැක. එසේ වන්නේ කවුරුන් විසින්, කා සඳහා, කුමන හේතු නිසා, කුමන ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් කවර ආකාර වලින්, කොපමණ කාලයක් මිඩංගු කරමින්, කුමක් උගන්වන්නේ ද? යනාදී වශයෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා සම්බන්ධ සියලුම සාධක විෂයමාලාව මගින් ම හැසිරවීමට තරම් නූතන විෂයමාලා සංකල්ප පුළුල්ව පවත්නා බැවිනි. (ලෝටන්, 1981)

විෂයමාලාවක ගුණාත්මක බව එහි ශක්‍යතාව, සඵලතාව හා අධ්‍යාපනික අගය මත රඳා පවතින බව එවකට විෂයමාලාව ඇගැයීම පිළිබඳව පැවති විවිධ නිර්වචන ගැන විවේචනාත්මක විග්‍රහයක් යෙදුණු කීත් කූපර් (1976) සඳහන් කරයි. මේවා සංවර්ධනය කිරීම සඳහා අධ්‍යාපනික ක්‍රියාවලිය ක්‍රියාත්මකව පවතින මුළු කාලය පුරාම එය මෙහෙය විය යුතු බව විෂයමාලා විශේෂඥයන් විසින් පෙන්වා දී ඇත. ඩී.කේ.වීලර් (1967) ජේ.එෆ්.කර් (1976) වැනි අය සිය විෂයමාලා සංවර්ධන ආකෘතිය චක්‍රීය ආකාරයෙන් ඉදිරිපත් කර තිබීමෙන් ඒ බව මනාව පැහැදිලි වේ. විෂයමාලාවක් කාර්යක්ෂමව සංවර්ධනය කර ගත හැක්කේ විෂයමාලාව ක්‍රියාත්මක කරන මුළු කාලය පුරා කෙරෙන අඛණ්ඩ ඇගැයුමකින් බව කර්ගේ අදහසයි.

විෂයමාලාව මෙහෙයවීම, සංවර්ධනය කිරීම මෙන්ම ඵලවල ගුණාත්මක බව තක්සේරු කිරීම භාරදූර කාර්යයකි. ශිෂ්‍යයකුගේ සාධනයේ ස්වභාවය ඇගැයීමෙන් නිකුත් කරනු ලබන සහතිකය පදනම් කර අධ්‍යාපන ක්‍රියාවලියේ නිමැවුම පිළිබඳව ඉතා වැදගත් තීරණ රැසක් ගනු ලබන හෙයින් සහතිකයේ වලංගුතාව රැක ගැනීම ද ඉතා වැදගත් වේ.

මේ අනුව කිසියම් අධ්‍යාපනික ක්‍රියාවලියක් සම්බන්ධව එහි,

i. මෙහෙයවීම

ii. විෂයමාලා සංවර්ධනය

iii. සාධනය හා ඇගැයීම

යන කාර්යයන් තුන ඉතා වැදගත් මෙහෙයන් තුනක් ඉටු කරයි. මේ ත්‍රිවිධ කාර්යයන් සාමූහිකව හෝ වෙන් වෙන් ව ඇගැයීමට ලක් කළ හැකි විෂයමාලාව ඇගැයීම් ආකෘතියක් ලෙස ස්ටෆල්බීම් ගේ කළමනාකරණ අභිමුඛ ආකෘතිය හෙවත් CIPP ආකෘතිය පෙන්වා දිය හැක.

දශක දෙකකටත් වඩා කාලයක සිට වෘත්තිමය ගුරුවරුන් බිහි කිරීමෙහිලා කොළඹ විශ්වවිද්‍යාලය සාම්ප්‍රදායික ක්‍රමයෙන් හා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය දුරස්ථ ක්‍රමයෙන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවන් මෙහෙයවන අතර එම විෂයමාලාවන්ගේ අවසන් නිමැවුමෙහි ගුණාත්මකභාවය ඇගයීම සම්බන්ධව කර ඇති පර්යේෂණ ඉතා විරලය. මේ නිසා ඉහත කී CIPP ආකෘතිය ඇසුරු කොට ගෙන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවන්හි ගුණාත්මකභාවය සෙවීම සඳහා සමස්ත විෂයමාලාවේ පොදු ස්වභාවය, එය මෙහෙයවන ආකාරය, විෂයමාලා අන්තර්ගතය මෙන්ම අධ්‍යාපන ඩිප්ලෝමාව ලැබූ ගුරුවරුන් ඒ පිළිබඳව දක්වන සංජානනයන් හා අවසන් නිමවුමෙහි ගුණාත්මකභාවය වසර දෙකකට පසුව ප්‍රායෝගිකව නිරීක්ෂණය කර ඇගැයීමෙන් ලැබූ දත්ත අනාවරණයන් ඔස්සේ මෙම පර්යේෂණ අවශ්‍යතා ඉටුකර ගැනීමට උත්සාහ දරන ලදි.